# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - විභාග ජයමග ප්‍රශ්න පත්‍රය

03

**71 සිංහල - II පත්‍රය** | **නව විෂය නිර්දේශය** | **කාලය - පැ. 3.00**

නම - | සැකසුම - දර්ශනපති ගිහාන් හෙට්ටිආරච්චි | දිනය -

**සැලකිය යුතුයි**

I කොටසේ 1 ප්‍රශ්නය ද II කොටසේ 2,3 ප්‍රශ්න ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1 ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මෙම **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

I කොටස, II කොටසේ පිළිතුරුපත් සමග අමුණා භාර දෙන්න

---

## I කොටස

1. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1. මූර්ධජ, අඝෝෂ, මහාප්‍රාණාක්ෂරය ඇතුළත් වරණය තෝරන්න

1) ඪ, ස, හ, ඛ, ෆ    2) ෆ, ඹ, ධ, ඨ, ඪ    3) ඣ, ඪ, ධ, ෆ, ඍ

4) ඹ, හ, ස, ඨ, ඵ    5) ඛ, ෂ, ඪ, ඡ, ඣ    (..............)

1.2. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න

1) වෛශාඛ්‍ය, ශාසනය, ජ්‍යෂ්ඨ, වක්‍රෝත්ති, ප්‍රාශ්වාස

2) වෛශාක්‍ය, සාසනය, ජ්‍යේෂ්ඨ, වක්‍රෝත්ති, ප්‍රශ්වාස

3) වෛශාඛ්‍ය, සාශනය, ජ්‍යේෂ්ඨ, වක්‍රෝක්ති, ප්‍රෂ්වාස

4) වෛශාක්‍ය, ශාසනය, ජ්‍යේෂ්ඨ, වක්‍රෝක්ති, ප්‍රශ්වාස

5) වෛශාඛ්‍ය, ශාසනය, ජ්‍යෂ්ඨ, වක්‍රෝක්ති, ප්‍රාශ්වාස    (..............)

1.3. අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න

1) උත්ප්‍රේක්ෂා, උබබස්, උපමා, උත්ප්‍රාස

2) සූක්ෂ්ම, ලව, ප්‍රේයස්, රස

3) රූපක, දීපක, යමක, ප්‍රේයස්

4) අපහ්නුති, අර්ථාන්තරන්‍යාස, දෘෂ්ටාන්ත, උපමා

5) අතිශයෝක්ති, ස්වභාවෝක්ති, ව්‍යතිරේක, උත්ප්‍රාසය    (..............)

1.4. පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න

1) සියලු අනුනාසික්‍ය අක්ෂර කණ්ඨයෙන් උපදී.

2) රේඵයේ හා රකාරාංශයේ ව්‍යාකරණ ලක්ෂණ සමාන ය.

3) සියලු ස්වර නියෝජනය කිරීම සඳහා පිල්ලම් භාවිත වේ.

4) 'ෆ' දන්තෞෂ්ඨජ අක්ෂරයක් ලෙස හැඳින්වේ.

5) ඕනෑ ම හල් අකුරකට පසු යෙදෙන 'ය' කාරය වෙනුවට '්‍ය' යෙදිය යුතුයි.    (..............)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න

1) ප්‍රධාන ඇමති, මහ විහාරය, ව්‍යාකරණ විමසුම, හිරු මඬල

2) ධාතු ගර්භය, ගොදුරු ග්‍රාමය, කය සංවරය, අප්‍රමාද වර්ගය

3) සූත්‍ර පිටකය, විජම් පිටකය, නිකැලැල් චරිත, භාෂා උපත

4) නෑ මිතුරු, ප්‍රාචීන භාෂා, නහෝ ගැබ, සම්බුදු සසුන

5) විදේශ ප්‍රවෘත්ති, ප්‍රවෘත්ති සාරාංශය, ක්‍රීඩා ප්‍රවෘත්ති, ප්‍රීති වාක්‍යය    (..............)

1.6. තත්සම වචනයක් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න

1) ප්‍රවීණ, ප්‍රමාණ, තර්කය, මිනිස්

2) ඓශ්වර්යය, සාමර්ථ්‍යය, නිහැඬියාව, සාර්ගර්භ

3) කල්‍යාණ, මිත්‍ර, ආර්ථික, ජනතාද්‍රෝහී

4) විශ්ව, ප්‍රභා, කාන්ති, මුද්‍රා

5) රමණී, අම්බර, චන්ද්‍ර, රශ්මි    (..............)

ගිහාන් හෙට්ටිආරච්චි

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න

1) කොළොඹ, කොස්, ළිඳ, ඔළුව

2) ගජ, කිරණ, අග්‍ර, යක්ෂ

3) අත්, රුක්, සමන්බඳුරු, කන්

4) ටෙලිග්‍රෑම්, පැන්සල, පොලිසිය, වරෙන්තුව

5) පාක්කුඩම්, පඩික්කම්, පදක්කම්, පූට්ටු (...............)

1.8. විභක්ති, විශේෂණ, අනාාර්ථ හා දකාරාර්ථ යන විභක්තිවලට අයත් සමාස පද පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න

1) අනුරු, කහබත්, දුන්වත්, මවුපිය

2) ගීනැටුම්, මත්තේගජන්, සරාසඳ, කළුගල්

3) නිසයුරු, හිරුසඳු, ගම්පහ, නරසී

4) අනේක, ගුරුපඬුරු, සරස, දැමිඳුරු

5) මිහිඳුම්, තනිතරුව, සුන්බත්, අඹුසැමි (...............)

1.9. කෘදන්තයක් නො වන පදයක් අන්තර්ගත වරණය තෝරන්න

1) ඇසිලි, ලියුම්, රුඳුණ, කැපූ

2) ස්මරණ, පිපෙනු, මදිනය, දිටු

3) නැසුණු, හැඬූ, සැපූ, පතළ

4) ගිලි, දවටනය, වගුළ, පෑ

5) හඳාළ, කෙරුම්, වැව්ලි, උපුල (...............)

1.10. පහත සඳහන් උද්ධෘතවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න

අ) බුදුගුණ **වනනුව** මෙය ලිවීමි.
ආ) වර වර ළඟට **කැන්දා**.
ඇ) මහල්ලා **ගැහෙමින්** සිටී.
ඈ) ඒත් පුතේ නුඹ **නාවොත්** දුක වැඩියි හිතේ.

1) පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අපර ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

2) අපර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

3) පූර්ව ක්‍රියා, අපර ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

4) අසම්භාව්‍ය ක්‍රියා, අපර ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා

5) අපර ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා (...............)

1.11. තද්ධිතයක් නොවන වචනයක් අන්තර්ගත වරණය තෝරන්න

1) සෞභාග්‍යය, සාමර්ථ්‍යය, කළටි, ගුණවතා

2) දැවමුවා, නෛතික, කාලීන, ලාංකේය

3) කැහැටු, කැඳිති, ගඟබඩ, පියාණෝ

4) ශාස්ත්‍රවේදියා, ඉන්දියානුවා, නීතිඥයා, ලාංකිකයා

5) පින්වතා, අරටු, මන්මත්, රුමත් (...............)

1.12. උපසර්ගයක් යෙදී නොමැති පදයක් සහිත පද පේළිය තෝරන්න

1) ප්‍රතිඵල, අනුනායක, අවජාත, සම්බන්ධය

2) උපකාර, නිර්දේශ, සාදර, වියෝගය

3) දුර්මතය, සංක්ෂිප්ත, ජනාදරය, නිර්වින්දක

4) උත්ප්‍රාසය, සමාචාර, පිරිසිදු, නිරනුමාන

5) නිශ්ශබ්ද, සනරාමර, ප්‍රතිබද්ධ, උද්වේගය (...............)

1.13. නිපාතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න

1) එම්බා, සහ, විසින්, පිණිස

2) පාසා, සේක, යුහු, පටන්

3) වදු, වගෙයි, වනාහි, නොලස

4) අරබයා, කොල, ඌයි, පුන

5) නො, නැවත, මිස, ඇයි (...............)

1.14. '**නොමඳ** **බඹරකුරු** **රැඳි** **මල්රෙහෙණු** පට' යන කාව්‍ය පාඨයේ වචන යෙදී ඇති අනුපිළිවෙළ අනුව තද කළු අකුරින් ඇති පද අයත් වන්නේ මින් කුමන ව්‍යාකරණ අංගවලට ද?

1) නිපාත, කෘදන්ත, සමාස, සන්ධි    2) නිපාත, සමාස, සන්ධි, කෘදන්ත

3) සන්ධි, සමාස, කෘදන්ත, නිපාත    4) සමාස, සන්ධි, කෘදන්ත, නිපාත

5) නිපාත, සන්ධි, කෘදන්ත, සමාස (...............)

1.15. අසමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන වරණය තෝරන්න

1) කාර්මික, සාත්ත්වික, ප්‍රාථමික, නාගරික

2) වකුටු, ඌෂ්ණ, ඉහටි, සිඟිති

3) උපේන්ද්‍ර, දුබල, ප්‍රවාස, උත්කර්ෂය

4) දසබල, තිනෙත්, ලඹසවන්, සහෝදර

5) අහෝ, අනේ, හෙට, බොල (...............)

1.16. සමාසයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න

1) අභාව, පෙම්බරදෑස, මුවපියුම, ඇද්දළ

2) පියුමාකර, නාවිකසෙබළු, සඳඑළිය, මරතොණ්ඩි

3) අඹගෙඩිය, අනූන, තුරුසෙනඟ, තණපඳුර

4) යථාකාල, උපනයන, නුමුහුන්, ගිරිනිගණ්ඨ

5) සුරමඟ, අනාථාධාර, මුංකැවුම්, සඳවත (...............)

1.17. එක ම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න

1) වප්පිහිය, වක්කඩ, කම්මල, අස්සන

2) අත්තම්, විස්සම්, පන්නම්, කම්මුල

3) කොස්සැට, වල්ලූරා, වක්කත්ත, බල්ලා

4) හෙළිල්ලඹු, වල්ලම්බලම, කොග්ගල, ගොක්කත්ත

5) රත්තා, මලසුන, නෙතගින්, සුරඟන (...............)

1.18. ව්‍යාකරණානුකූල ව නොගැළපෙන පදයක් සහිත වරණය තෝරන්න

1) පස්මහබැලුම්, අනභිමුඛ, ප්‍රවර, දැවකම්

2) වරලස, බහුජන, ධර්මිෂ්ඨ, දියඹ

3) ලියුම්, පැමිණි, විසුළ, බිඳෙන

4) දිගැසි, වෙරළාසන්න, සියැසින්, සඳෙව්

5) කියද්දී, යද්දී, වසන කල්හි, කපත (...............)

1.19. ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න

1) ඡන්දදායකයෝ ප්‍රීති ඝෝෂා නගද්දී අපේක්ෂකයෝ උද්දාමයට පත් වූහ.

2) තෝ ද මම ද යහළුවෝ වෙහු.

3) ගායිකාවක වන ඇය ගුරුවරියක් ද වූවා ය.

4) මේ පන්තියේ අද ළමයි නැත.

5) මා හෙට කොළඹ යමි. (...............)

1.20. ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න

1) සාගර ජලය ඔබ නිසා අප්‍රමාණ ව හඬා ඇත.

2) කාන්තා හිංසනය පිටුදකින්න රට පුරා වැඩසටහන් ඇරඹේ.

3) ස්වර්ග රාජ්‍ය වෙනුවෙන් යන්තං හෝ ඉඩක් දෙන්න.

4) මේව අහස පොළොව උහුලන්නැති අපරාධ.

5) ඉවක් බවක් නැති වන සංහාරය අනාගයට රටක් ඉතුරු කරාවි ද (...............)

(ලකුණු - 20)

# II කොටස

මෙම කොටසින් 2,3 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මනුෂ්‍යයා ජීවීන් අතර අසහාය තත්ත්වයක් දරයි. අන්‍ය සත්ත්වයන් සහිත වූ ජීව ලෝකය මෙන් ම තමා අවට ඇති ද්‍රව්‍ය ලෝකය ද පාලනය කිරීමේ ශක්තියක් මනුෂ්‍යයා ලබා සිටී. ඔහු මෙබඳු තත්ත්වයක් ලැබුවේ කෙසේ ද?

අන්‍ය සත්ත්වයන් අබිබවා මෙබඳු තත්ත්වයක් ලැබීමට මනුෂ්‍යයාට හැකි වූයේ ඔවුනට නොමැති අන්දමේ ඉන්ද්‍රිය ශක්තියක් සහ බුද්ධි ශක්තියක් ඔහු සතු බැවිනි. ඉන්ද්‍රිය ශක්තිය අතින් මනුෂ්‍යයාගේ අද්විතීය භාවය ඔහු අන්‍ය සත්ත්වයන්ට වඩා සියුම් අන්දමින් අත්, පා යනාදිය උපයෝගී කර ගැනීමට සමත් ව සිටීමෙන් පැහැදිලි වේ. සිය ඉන්ද්‍රියයන් ක්‍රමානුකූල ව මෙහෙයවීමෙන් විවිධ වස්තූන් නිර්මාණයට මනුෂ්‍යයා සමත් ය. මනුෂ්‍ය ජීවියා අන්‍ය ජීවීන් අබිබවා අසහාය ශිෂ්ටාචාරයක් ගොඩ නැංවූයේ මේ සමත්කම නිසා ය. මනුෂ්‍යයාගේ බුද්ධිය ද අන්‍ය සත්ත්වයන්ගේ බුද්ධිය අබිබවා ලූ අවයවයක් බව පැහැදිලි කරුණකි. අත්, පා යනාදි ඉන්ද්‍රියයන් ක්‍රමානුකූල ව පාලනය කිරීමේ ශක්‍යතාව මනුෂ්‍යයා ලබා ඇත්තේ මනුෂ්‍ය බුද්ධීන්ද්‍රියයේ ශක්ති මහිමය නිසා යැ යි පැවසිය යුතු ය. මොළයේ ඇතැම් කොටස් අනතුරට භාජන වූ අවස්ථාවන්හි දී ඊට සම්බන්ධව අන්‍ය ශරීර ඉන්ද්‍රියයන් ද ක්‍රියා විරහිත වන අයුරු අපට දක්නට ලැබෙන බැවිනි. තව ද, අන්‍ය සත්ත්වයන්ගේ මනසට ගොදුරු වන්නේ තමා ඉදිරිපිට ඇති දේ පමණක් වුව ද මනුෂ්‍යයාට අතීතයේ පැවති දේ මෙන් ම අනාගතයේ ඇති විය හැකි දේ ද මනසෙහි මවා ගනිමින් තම කටයුතු සම්පාදනය කර ගත හැකි ය.''

1. මිනිසා අනෙක් සත්ත්වයන්ට වඩා අසහාය තත්ත්වයක් දරන්නේ කුමක් නිසා ද?
2. මිනිසාට මෙම ශක්තිය ලැබුණේ කුමක් නිසා ද?
3. අනෙක් සතුන් අබිබවා ශිෂ්ටාචාරයක් ගොඩ නැඟීමට මිනිසා සමත් වූයේ ඇයි?
4. අත්, පා ආදි අවයවයන් මනා ව පාලනය කිරීමේ හැකියාව මිනිසාට ලැබුණේ කෙසේ ද?
5. ශරීර අවයව හා මොළය අතර සම්බන්ධතා ඇති බව දැක්වීමට මෙහි දක්වා ඇති සාධකය කුමක් ද?
6. මෙම ඡේදයට සුදුසු මාතෘකාවක් යෝජනා කරන්න. (ලකුණු - 12)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

මීට කලකට පෙර සිංහල පණ්ඩිතයන් අතින්, පුරාතන සිංහල පද්‍යය පමණ, ගද්‍යය සංග්‍රහය නොලැබුයේ, විස්තරාර්ථ වර්ණනය, අලංකාර විභාගය, යනාදීන් විසින් තමන්ගේ උගත්කම් ඇද බෑමට සිංහල ගද්‍යය නො තැන ය'යි ඔවුන් සැලකූ බැවිනැ'යි සිතමි. අවුරුදු විස්සකට තිහකට පමණ පෙර කවිකාරයන් බහුල වුව ද තමන් සිතූ සිතුම් හා පැතූ පැතුම් පණ ඇති බසින් පැහැදිලි ව ලියන්නට පුළුවන් ලේඛකයන් දැන් මෙන් බහුල නො වූයේ, පණ්ඩිතයන් පුරාණ සිංහල ගද්‍යය නො තකා පද්‍යය පමණක් සැලකූ නිසා විය යුතු ය.

ගද්‍ය භාෂාව කාලානුරූප ව හැඩ ගැසීමට, අනෙක් නොයෙක් කරුණුත් සමඟ සම්බන්ධ කිරීමට ද අනුබලයක් වී ය. මෙකල අමුතු භාෂා විලාසයන් හා රීතින් ස්වෝත්සාහයෙන් හැඩගසා ගැනීමට වැයම් කරන ග්‍රන්ථ කාරයන්, අමාවතුර ය, සද්ධර්ම රත්නාවලිය ය, බුත්සරණ ය, ථූපවංශය යන ආදි පුරාතන ගද්‍යයන්ගෙන් ලත් පෝෂණය ඔවුන්ගේ පොතපතින් ම හැඳින ගත හැකි ය. සිංහල ගද්‍ය ග්‍රන්ථයන් වස්තු විසින් හා රචනා විලාසයෙන් ගතානුගතික වුව ද, ශ්‍රේෂ්ඨත්වයෙහි ගැණෙන කිහිපයක් නවතායෙන් කියවිය හැකි ය. අමාවතුර, බුත්සරණ, සද්ධර්ම රත්නාවලිය යන මේ වාසගම් පොත් තුන වූ කලී ගතානුගතික සිංහල ග්‍රන්ථකාරයන් අතුරෙන් තිදෙනකුගේ පිරිමිකම් හා කල්පනා ශක්තිය හෙළි කරන කෘතීහු ය යි සිතමි. කිව යුත්ත කොටින් ද ව්‍යක්ත ලෙසින් ද සිත් කා වදින පරිදි ද කීමට ගුරුළුගෝමීහු, පාලි භාෂාව අනුව ගොස් තමන්ගේ ම ගතිගුණවලට හා සිතීම්වලටත් අනුකූල, හදවතට වඩා බුද්ධියට ප්‍රිය වූ, කාන්තිමත් භාෂා විලාසයක් නිපදවූහ. ඇනුම් පද කීමෙහි සමත් ගුරුළුගෝමීහු, පොත පත උගැන්මෙන් ලත් දැනුමෙන් රහල් හිමියන්ට දෙවැනි වුව ද, බුද්ධි මහිමයෙන් ඔවුන් ද ඉක්මවූහ. ගුරුළුගෝමීන්ගේ භාෂාව, ඔවුන්ගේ කල්පනා ශක්තිය මැඬගෙන නැගුණ බුද්ධියට රුචි වූ පරිදි විකසිත විකසිත වූවක් බව, අමා වතුරෙහි නොයෙක් තැන දක්නා ලැබෙන වර්ණයන්ගේ අනුසාරයෙන් නිශ්චය කළ හැකි ය. (ලකුණු - 13)

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300-350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

i. සාරධර්ම වර්ධනයෙහි ලා කලාවේ කාර්යභාරය.

ii. අන්තවාදය මානව වර්ගයාගේ යහ පැවැත්මට තර්ජනයකි.

iii. අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි දක්නට ඇති නව ප්‍රවණතා.

iv. ශ්‍රී ලංකාවේ වර්තමාන ආහාර රටා හා සෞඛ්‍ය ගැටලු.

v. අන්තර් ජාතික අර්බුද හමුවේ ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය. (ලකුණු - 25)

**4.** (අ) පහත දැක්වෙන වාක්‍යවල **සදොස්** තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

i) තොටගමුවේ රාහුල හිමියෝ කෝට්ටේ යුගයේ පඬිවරුන් අතර ඉහළින් ම වැජඹුණාහ.

ii) ශිෂ්‍ය නායකයෝ උපකුලපතිතුමා හමුවීමට ගියේ විභාග පිළිබඳ සාකච්ඡා කිරීමට ය.

iii) විශ්වවිද්‍යාලයේ අවසාන වර්ෂයේ ශිෂ්‍යාවක් සරසවි රැජින වශයෙන් තෝරා ගත්තා ය.

iv) සාහිත්‍ය උගන්වන සියල්ලෝ ම විචක්ෂණශීලීන් වෙත්වා!.

v) සියලු ම පාරිභෝගිකයන් ද වෙළඳ දැන්වීම් කියවති'යි මම නොසිතමි.

(ආ) පහත දැක්වෙන වාක්‍ය **කර්මකාරකයට** හරවන්න

i) පැරණි සිත්තරු ජාතක කථා බිතුසිතුවමට නැගූහ.

ii) අධ්‍යක්ෂවරයා අපේ විද්‍යාලයට ගණිත ගුරුවරියක පත් කළේ ය.

iii) නව කාර්මාන්ත ශාලාවෝ නොයෙක් විෂ වායූන් පතුරවා හරිති.

iv) සිංහල භාෂා ගුරුවරිය කිහිපවරක් මා ඇමතුවා ය.

v) ප්‍රවීණ ජනමාධ්‍යවේදිනියක් මහත් හරසරින් තොප පිළිගත්තා ය.

(ඇ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න

1) සරසවි (ශිෂ්‍යයන්/ශිෂ්‍යයෝ) බොහෝ (දෙනෙක්/දෙනෙකු) නවක වධය හෙළා දකිති.

2) (ඔවුන්/ඔවුහු) වැඩිදෙනා (ගුරුවරු/ගුරුවරුන්) හමු වී සිය අදහස් දැක්වූහ.

3) (වැඩිහිටියන්/වැඩිහිටියෝ) දෙන උපදෙස්වලට (දරුවන්/දරුවෝ) විරුද්ධ වන්නේ නැත.

4) ගීත (රචකයෙකු/රචකයෙක්) වූ ආනන්ද සමරකෝන් දක්ෂ (ගායකයෙක්/ගායකයෙකු) ද විය.

5) (නායකයන්/නායකයෝ) ආදර්ශවත් වෙත් නම් රට (වැසියන්/වැසියෝ) ද ඔවුන් අනුගමනය කරනු ඇත.

(ලකුණු - 15)

**5.** පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය දක්වන්න.

i) **වැහිදිය** මහ බිම තෙමුවට බිම **තෙමන්නෙ** වැහි විතර **ද**?.

වැහිදිය - සමාස තෙමන්නෙ - කෘදන්ත ද - නිපාත

ii) ඔය ඇස් **අමතක** වෙන්න **නම්** **මගේ** ඇස් පියවෙන්න වෙයි.

අමතක - උපසර්ග නම් - නිපාත මගේ - විභක්ති

iii) **ඔබේ** අත **ගෙන** පෙර සැඳෑවක **උයන්තෙර** හිඳ ආදරෙන්.

ඔබේ - විභක්ති ගෙන - ක්‍රියා උයන්තෙර - සමාස

iv) ඔබ අත ගෙන ගිය වීදියෙ **ඇය** හා යනවා - **පුංචිපුතා** **අතැඟිල්ලක** එල්ලී එනවා

ඇය - විභක්ති පුංචිපුතා - සමාස අතැඟිල්ලක - සන්ධි

v) රන් **කොපුලත** බිඳු **කඳුළැලි** **පිසදා** හරිමී.

කොපුලත - තද්ධිත කඳුළැලි - සන්ධි පිසදා - ක්‍රියා (ලකුණු - 15)

**6.** (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න

(අනභිභවනීය, සමලංකෘත, අකෘතඥ, වාදීභසිංහ, අව්‍යක්ත, සෞම්‍ය)

i) හෙතෙම තමා හමුවෙහි තර්ක අවියෙන් පහර දෙන්නවුන් මැඩුයේ ......................... වෙසිනි.

ii) සතුරන් හමුවේ ....................... සටන් කළ සෙබළා ජය ලැබුවේ ය.

iii) වැත්තෑවේ තෙරිඳු ....................... වීදැයි නැවත සොයනු වටී.

iv) සියල් සිරින් ...................... නිදහස් උලෙළක් පැවැත්වීමට හැකි වීම ගැන ඔහු ආඩම්බර විය.

v) මුග්ධ, බොළඳයන්ගේ .......................ප්‍රකාශ හමුවේ අපි බිය නොවෙමු.

vi) තියුණු නිරීක්ෂණය මෙන් ම අවැසි විටක ........................ වීමට ද පාලකයා දනී. (ලකුණු - 3)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න

i) දිගු + ඇසියක ii) යහ + එන

iii) කර + අටි iv) ගඟ + පොළ

v) ජිව්හා + ඉන්ද්‍රිය vi) වට + උර (ලකුණු - 3)

(ඇ) තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න

i) **මගීන්ගේ** ඇගේ හැපී **ධාවකයින්ගෙන්** එක් අයෙක් බිම වැටුණි.

ii) පෙර දින **සීරුවෙන්** පල්ලම් බසිමින් තිබූ රථයක් කණ්ඩියෙන් **ඇළට** පෙරළුණි.

iii) **ළමුන්** වෙනුවෙන් සංවිධානය වූ සංදර්ශනය අවලංගු වූ බව **සංවිධායකයෝ** පවසති. (ලකුණු - 3)

(ඈ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න

i. ළමයා ඉගෙනීමට දක්ෂ ය එහෙත් ඔහුට යාමට ළඟ පාත හොඳ පාසලක් නැත.

ii. අභිනවගුප්තාචාරීහු ප්‍රතිභාව අපූර්ව වස්තු නිර්මාණය කිරීමේ දක්ෂතාව වශයෙන් විග්‍රහ කළහ.

iii. වැවක අංග අතරට ගැනෙන රළපනාව යන්නට දිය කඩනය යන නම ද අනුචිත නැත. (ලකුණු - 3)

(ඉ) පහත දැක්වෙන ප්‍රකාශනවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න

i) 'මෙයින් දින සතක් ගිය තැන ඔහු හා මම වාද කරමි'යි ගුත්තිලයෝ කීහ.

ii 'ගරු සභාපතිතුමනි, අප විඳින දුක් පිළිබඳ ඔබේ නෙත් යොමනු මැනවැ'යි සභිකයෝ ඉල්ලති.

iii) 'අප්‍රමාද ව මෙතැනින් පිටවෙව්'යි රජු මහජනයාට ගුගුළේ ය. (ලකුණු - 3)

**7.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

කාව්‍යයේ වස්තු සාරය පිළිබඳ ව අපේ කාලය එ තරම් ගෙවිය යුතු නො වේ. බඹදත් රජුගේ කීර්තිමත් වාසල ගාන්ධර්වයා වූ ගුත්තිල ඇදුරු වෙත දිනක් **ගාන්ධර්වයකු** වීමේ අටියෙන් තරුණයෙක් පැමිණියේ ය. සිය නිජ පුරය වූ **උදේනියට** පැමිණි වෙළෙඳුන් කිහිප දෙනෙකු අතින් ගුත්තිල ඇදුරු පිළිබඳ කීර්තිය හේ අසා සිටියේ ය. තරුණයා කෙරෙහි පැහැද සිටි සිය දෙමාපියන්ගේ **පෙරැත්තය** නිසා මුත් තම චෛතසිකයන්ට පටහැණි ව ගුත්තිල ඇදුරු ඔහුට වීණා ශිල්පය ඉගැන්වී ය. මූසිල තෙමේ (ඒ එකී තරුණයාගේ නමයි) අතිදක්ෂ ශිෂ්‍යයකු බව පසක් කෙරෙමින් කල් නො යවා ම රාජ ගාන්ධර්වයා දත් සියලු **ශිල්පයෙහි** කෙළ පැමිණියේ ය. ගුත්තිල ඇදුරුගේ **උදවුවෙන්** රාජ සභාවෙහි දිවෙලක් ද ඔහුට ලැබිණි. එහි දී සිය ගුරුහු හා තමා සමානයකු කොට සැලකූ මූසිල තෙමේ සමාන සේවයට සමාන වැටුපක් ඉල්ලා සිටියේ ය. **ගෝළයා** ගුරුවරයා තරම් දක්ෂයෙකැ'යි රජු නොපිළිගත් හෙයින් තරුණ මදයෙන් මෙහෙයනු ලැබූ මූසිල තෙමේ තමා හා වාදයකට පැමිණෙන සේ **ගුරුහුට** අභියෝග කෙළේ ය.

i) ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදිය පිළිවෙළට සකස් කරන්න.

ii) ගාන්ධර්වයා, චෛතසිකයන්ට, ඇදුරු යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙන ම ලියන්න.

iii) ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න

1. ඝෝෂ මහාප්‍රාණ අක්ෂරයක් සහ අර්ධස්වරයක් එක ළඟ යෙදුණු වචනයක්

2. අන්තඃස්ථාක්ෂර දෙකක් එක ළඟ යෙදුණු වචනයක්

3. මූර්ධජ අක්ෂරයක් සහ සඤ්ඤක අක්ෂරයක් පිළිවෙළින් යෙදී ඇති වචනයක්

iv) පහත සඳහන් පද විසන්ධි කොට සන්ධි විධිය දක්වන්න

අතින්, තරුණයා, දිවෙලක්

v) පහත දැක්වෙන ව්‍යාකරණාංගවලට උදාහරණ වචනය බැගින් ඡේදයෙන් උපුටා ලියන්න

උපසර්ග, ආධාර විභක්ති, පූර්ව ක්‍රියා (ලකුණු - 15)

**8.** පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න

i) අන්‍යාර්ථ සමාස

ii) ස්වාර්ථයේ තද්ධිත ප්‍රත්‍යය

iii) අනවසාන ක්‍රියා

iv) සමාන ස්වර දීර්ඝ සන්ධිය

v) අවධි විභක්තිය (ලකුණු - 15)